සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## BUDDHISM - I
බුද්ධ ධර්මය – I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදු සසුනෙහි සෘද්ධිලාභීන් අතර අග්‍ර වූයේ,
   (i) සැරියුත් හිමි (ii) මුගලන් හිමි
   (iii) ආනන්ද හිමි (iv) මහා කාශ්‍යප හිමි

2. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි සම්මා සංකප්ප යනු,
   (i) නිවැරදි දැකීම (ii) නිවැරදි වචන
   (iii) නිවැරදි කල්පනාව (iv) නිවැරදි සිහිය

3. මහිච්ඡතාව යනු,
   (i) අසීමිත ආශාවන් ඇති බව (ii) පහසුවෙන් පෝෂණය කළ හැකි බව
   (iii) අල්පේච්ඡ බව (iv) සැහැල්ලු බව

4. අටලෝ දහමෙහි සුවදායක දෙකක් වන්නේ,
   (i) සැප - දුක (ii) යස - අයස
   (iii) ලාභ - ප්‍රශංසා (iv) නින්දා - ප්‍රශංසා

5. සිඟාලෝවද සූත්‍රය දේශනා කළේ,
   (i) සප්වග තාපසවරුන්ට (ii) කාලාම වැසියන්ට
   (iii) අනේපිඬු සිටුතුමාට (iv) සිඟාල ගෘහපතියාට

6. ලෝක පාලන ධර්ම ලෙස හඳුන්වන්නේ,
   (i) හිරි ඔත්තප්ප (ii) ත්‍රි ලක්ෂණ
   (iii) චාරිත්‍ර සීල හා වාරිත්‍ර සීල (iv) පන්සිල් හා අටසිල්

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

7. "චතු අප්පමඤ්ඤා" යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) සතර සංග්‍රහ වස්තු (ii) සතර බ්‍රහ්ම විහරණ

(iii) සතර අගති (iv) චතුරාර්ය සත්‍යය

8. ගාථා 423 කින් හා වග්ග 26 කින් ද යුක්ත ධම්ම පදය,

(i) බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වේ

(ii) පිරුවානා පොත් වහන්සේ ලෙස හැඳින්වේ

(iii) භික්ෂූන් වහන්සේලාගේ විනය මාර්ගය ලෙස හැඳින්වේ

(iv) බෞද්ධයන්ගේ වත් පිළිවෙත් ලෙස හැඳින්වේ.

9. බුද්ධමාතා යන ගරු නාමයෙන් හැඳින්වූයේ,

(i) භද්ද කච්චායනා තෙරණිය (ii) මහා ප්‍රජාපතී ගෝතමිය

(iii) මහාමායා දේවිය (iv) ඛේමා තෙරණිය

10. "මහරජ, ඒ ඔබේ වංශයයි, අපේ වංශය බුද්ධ වංශයයි." මෙම ප්‍රකාශයට සවන් දී සිටියේ,

(i) කොසොල් රජතුමා (ii) සුදොවුන් රජතුමා

(iii) අජාසත් රජතුමා (iv) බිම්බිසාර රජතුමා

11. භික්ෂුණී ශාසනය ආරම්භ වූයේ බුද්ධ ශාසනය ආරම්භ වී වසර,

(i) 08 කට පසුවය (ii) 10 කට පසුවය

(iii) 05 කට පසුවය (iv) 12 කට පසුවය

12. සුදොවුන් රජතුමා තම පුතුට දෙවන වර වැන්දේ,

(i) අසිත තාපස තුමා පැමිණි දින (ii) වප් මඟුල් දින

(iii) කිඹුල්වත් පුර ගමනේ දී (iv) බුදු වූ අවස්ථාවේ

13. අටමස්ථාන යටතට අයත් නොවන්නේ,

(i) ථූපාරාමය (ii) ලංකාරාමය

(iii) මිරිස වැටිය (iv) දීඝවාපිය

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

14. මෙලොව පරලොව සැපත පිණිස පිළිගන්වනු ලබන සියලු දාන පිළිගැනීමට සුදුසු වන හෙයින් මහා සංඝරත්නය,

(i) අඤ්ජලීකරණීය වේ (ii) දක්ඛිණෙය්‍ය වේ

(iii) ආහුනෙය්‍ය වේ (iv) සාමීචිපටිපන්න වේ

15. සංඝ රත්නය ලොවට දායාද වන්නේ,

(i) ඇසළ පොහෝ දින (ii) වෙසක් පෙහෝ දින

(iii) වප් පෙහෝ දින (iv) දුරුතු පොහෝ දින

16. බුදුරදුන් අවසන් වස් කාලය ගත කළේ,

(i) උදේනි නුවර (ii) සැවැත් නුවර

(iii) බේලුව ගමේ (iv) බරණැස

17. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට සූදානම් වන අවස්ථාවේ භාවනානුයෝගීව සිට රහත් වූයේ,

(i) ධම්මාරාම තෙරුන් (ii) උපාලි තෙරුන්

(iii) ආනන්ද තෙරුන් (iv) රාහුල තෙරුන්

18. බුදුන් වහන්සේට අවසන් වරට දන් පූජා කළේ,

(i) අනේපිඬු සිටුතුමා (ii) සුදොවුත් රජතුමා

(iii) විශාඛා උපාසිකාව (iv) චුන්දකර්මාර පුත්‍රයා

19. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ධාතු තැන්පත් කොට ස්තූපයක් කරවන ලද්දේ,

(i) ලිච්ඡවීන් විසින් (ii) ශාක්‍යයන් විසින්

(iii) සුදොවුන් රජු විසින් (iv) භික්ෂුණීන් වහන්සේලා විසින්

20. අන් අයට විපතක් කරදරයක් දුකක් ඇති වූ විට ඒ පිළිබඳව ඇති වන අනුකම්පාව,

(i) මුදිතා නම් වේ (ii) මෙත්තා නම් වේ

(iii) උපෙක්ඛා නම් වේ (iv) කරුණා නම් වේ *(ලකුණු 2 × 20 = 40)*

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

❖ **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 04 ක් සඳහාත් පිළිතුරු සපයන්න.**

1. (i) ත්‍රී ශික්ෂාවෙන් දෙකක් නම් කරන්න.

(ii) නොකළ යුතු වෙළෙඳාම් 05කි. ඉන් දෙකක් ලියන්න.

(iii) "නිබ්බානං පරමං සුඛං" මෙහි අර්ථය ලියන්න.

(iv) "අභිධජ මහා රට්ඨගුරු" නාමයෙන් පිදුම් ලැබූ තෙරුන් වහන්සේ කවුද?

(v) සම්පූර්ණ කරන්න.

කැලේ තිබෙන කොයි දේවත් රස වේවා

මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා

.............................................................................

.............................................................................

(vi) අෂ්ට ගරු ධර්මවලින් දෙකක් ලියන්න.

(vii) බුදු සසුනේ අග්‍ර දායක හා දායිකා නම් කරන්න.

(viii) භාවනා කිරීමේ දී ගැහැණු දරුවන් හා පිරිමි දරුවන් අසුන් ගත යුතු ආකාර දෙකක් ලියන්න.

(ix) යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී යන්නෙහි අර්ථය ලියන්න.

(x) සම්පූර්ණ කරන්න.

හන්දදානි භික්ඛවේ - ආමන්තයාමි වෝ

....................................... - ............................................ *(ලකුණු 20 යි. )*

2. (i) අත්හැරිය යුතු අන්ත දෙකකි. ඒ මොනවා ද? *(ලකුණු 02 යි.)*

(ii) කයින් සිදුවන අකුසල කර්ම තුනකි. නම් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) පන්සිල් ආරක්ෂා කිරීමෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි.)*

3. (i) ත්‍රිකෝටි පාරිශුද්ධිය අංශ තුනකින් යුතුය. ඉන් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි.)*

(ii) චාරිත්‍ර සීලය වාරිත්‍ර සීලය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 03 යි.)*

(iii) සීලවන්ත ජීවිතයක ඇති වැදගත්කම කෙටියෙන් පහදන්න. *(ලකුණු 05 යි.)*

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

4. (i) ප්‍රජාපතී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. *(ලකුණු 02 යි.)*

(ii) භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමට මුල් වූ තෙරුන් වහන්සේ කවුද? එහිදී මහා ප්‍රජාපතී ගෝතමියට පිළිගැනීමට සිදුවූ කරුණු දෙකක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(iii) මහා ප්‍රජාපති ගෝතමී තෙරණියගේ ශාසනික සේවාව පහදන්න. *(ලකුණු 05 යි.)*

5. (i) බුදු සිරිතෙන් අපට ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න. *(ලකුණු 02 යි.)*

(ii) ඉන් එකක් විස්තර කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) චරිතවත් ජීවිතයක ඇති වටිනාකම පහදන්න. *(ලකුණු 05 යි.)*

6. (i) තාදි ගුණය යනු කුමක් ද? *(ලකුණු 02 යි.)*

(ii) සම්පූර්ණ කරන්න.

පුට්ඨස්ස ලෝක ධම්මෙහි

..................................................................

..................................................................

.................................................................. *(ලකුණු 03 යි.)*

(iii) අටලෝ දහමින් කම්පා නොවී, සිසු ජීවිතයක් සාර්ථක කර ගන්නා ආකාරය කෙටියෙන් පහදන්න. *(ලකුණු 05 යි.)*

7. (i) සිඟාලෝවාද සූත්‍රයේ පූජ්‍ය පක්ෂය නම් කර ඇත්තේ කවර දිසාවකට ද? *(ලකුණු 02 යි.)*

(ii) පූජ්‍ය පක්ෂයෙන් ගිහි පක්ෂයට ඉටු වෙන යුතුකම් 03 ක් ලියන්න. *(ලකුණු 03 යි.)*

(iii) යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් ලබමු. පන්ති කාමරය ඇසුරින් මේ කියමන සනාථ කරන්න. *(ලකුණු 05 යි.)*